# සීමාසහිත සීනෝර් පදනම

# පුරප්පාඩු

**- ව්‍යාපාර ව්‍යුහය -**

1967 වර්ෂයේ දී ආරම්භ කරන ලද සීමාසහිත සීනෝර් පදනම ධීවර අමාත්‍යාංශය යටතේ පාලනය වන නාවික යාත්‍රා, විනෝද යාත්‍රා සහ ධීවර යාත්‍රා නිෂ්පාදනය කරන එකම රාජ්‍ය සමාගම වේ.

සීමාසහිත සීනෝර් පදනමේ පුරප්පාඩු පවතින පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 1. කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන (MA 1-1) III ශ්‍රේණිය

**පුරප්පාඩු - 02**

➢ **සුදුසුකම් :**

බාහිර අයදුම්කරුවන් සඳහා අධ්‍යාපන සුදුසුකම් :

(අ.) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී

I. සිංහල / දෙමළ

II. ගණිතය

III. ඉංග්‍රීසි භාෂාව

යන විෂයයන් ඇතුළුව විෂයයන් හතරකට (04) කට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් (06) කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

(ආ.) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් තුනක් (03) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

(ඇ.) තනතුරට විශේෂිත වෙනත් සුදුසුකම් :

පරිගණක වදන් සැකසුම පිළිබඳව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත්තා මාස හයකට (06) නොඅඩු පාඨමාලාවක් හදාරා තිබීම.

➢ වයස : අවු. 18 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි අය විය යුතුය.

➢ වැටුප් පරිමාණය : MA 1-1 රු. (27,910/- 10X300/- 7X350/- 4X495/- 20X660/= 48,540/-

➢ දීමනා : භාණ්ඩාගාර අනුමත ජීවන වියදම් දීමනාව.

## 2. අලෙවි නිලධාරී (JM 1-1) II ශ්‍රේණිය

**පුරප්පාඩු - 02**

➢ **සුදුසුකම් :**

බාහිර අයදුම්කරුවන් සඳහා අධ්‍යාපන සුදුසුකම් :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක අලෙවිකරණය පිළිබඳ උපාධියක් ලබා තිබීමෙන් පසු වසර 01 ක පළපුරුද්දක් ලබා තිබීම.

➢ වයස : අවු. 22 ට නොඅඩු හා අවු. 35 ට නොවැඩි අය විය යුතුය.

➢ වැටුප් පරිමාණය : JM 1-1 රු. (42,600/- 10X755/- 18X1,135/- = 70,580/-

➢ දීමනා : සන්නිවේදන බිල්පත් ගෙවීම්, භාණ්ඩාගාර අනුමත ජීවන වියදම් දීමනාව.

රජයේ සේවයේ දැනටමත් නිරත අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ අංශ ප්‍රධානීන් හරහා ඉදිරිපත් කළ යුතු වේ.

තමා විසින් සම්පූර්ණ කරන ලද අයදුම්පත් මෙම දැන්වීමෙන් දින 14 ක් තුළ අයදුම්කරන තනතුර ලියුම් කවරයෙහි වම් කෙළවරෙහි සඳහන් කොට ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට යොමු කරන්න.

**සභාපති,**
**සීමාසහිත සීනෝර් පදනම,**
**අංක. 335 (90), ඩී.ආර්. විජේවර්ධන මාවත,**
**කොළඹ 10.**